**ශීර්ෂය 310 - රජයේ කර්මාන්ත ශාලාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 310 - රජයේ කර්මාන්ත ශාලාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 17 දින රජයේ කර්මාන්ත ශාලාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**21. විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

රජයේ කර්මාන්ත ශාලාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 231.58 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 162.32 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රජයේ කර්මාන්ත ශාලාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 69.25 ක් හෙවත් සියයට 29.90 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

| **වියදම** | **දිනට 31 දෙසැම්බර් 2015** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 79.38 | 75.57 | 3.81 | 4.80 |
| මූලධන | 152.20 | 86.76 | 65.44 | 43.00 |
| **එකතුව** | **231.58** | **162.32** | **69.25** | **29.90** |

## 22. අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ කර්මාන්ත ශාලාවට අදාළ විෂය අංක 31001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 28.63 | 20.82 | 20.63 | 25.10 | 128.00 | 81.40 |

### 2.2.2 ගබඩා අත්තිකාරම් ගිණුම

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංක 31002 දරන ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සිමාව | තථ්‍ය | අවම සිමාව | තථ්‍ය | උපරිම සිමාව | තථ්‍ය | උපරිම සිමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ර.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 120.00 | 116.87 | 120.00 | 124.88 | 80.00 | 59.49 | 20.00 | - |

### 2.2.3 වාණිජ අත්තිකාරම් ගිණුම

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංක 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ර.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 308.00 | 304.90 | 280.00 | 341.13 | 180.00 | 123.30 | 5.00 | 2.26 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංක 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

**මූල්‍ය ප්‍රතිඵල**

| 2015 | | 2014 | |
|---|---|---|---|
| ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.29 | 4.09 | 8.07 | 7.87 |

## 2.3 අග්‍රිම ගිණුම

රජයේ කර්මාන්ත ශාලාව යටතේ වූ අංක 7002/0000/00/0043/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 18.62 ක් වී තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

රජයේ කර්මාන්ත ශාලාව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 26.09 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0008/0046/000 | 24.03 |
| 6000/0000/00/0001/0064/000 | 1.33 |
| 6000/0000/00/0002/0082/000 | 0.49 |
| 6000/0000/00/0013/0054/000 | 0.05 |
| 6000/0000/00/0016/0034/000 | 0.19 |
| **එකතුව** | **26.09** |

## 2.5 විගණන නිරීක්ෂණය

----------------------

රජයේ කර්මාන්ත ශාලාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

## 3.1 විසර්ජන ගිණුම

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අයවැය විචලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් නිසි අධ්‍යයනයකින් තොරව පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් ප්‍රතිපාදන ලබා ගැනීම නිසා වැය විෂයයන් 02 ක් සඳහා ලබා ගත් අතිරේක ප්‍රතිපාදනවලින් සියයට 100 ක් හා සියයට 98.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.3,418,713 කින් ඉක්මවා රු.15,418,713 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------

විෂය අංක 31001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,851,233 ක් වු අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) පාලන ගිණුමේ දැක්වෙන ගැලපුම් නොකළ රු.15,800 ක වටිනාකම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම්

------------------------

වර්ෂ ක් ඉක්මවූ 2 එකතුව රු.241,696 ක් වූ තැන්පතු 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භ වී මාස 2 කට පසුව පිළියෙල කර තිබුණි.

### 3.4.2 අභ්‍යන්තර විගණනය

------------------------

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

------------------

දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමකට අදාළව මාස 06 කට වැඩි කාලයකට පෙර නිකුත් කර තිබුණු එකතුව රු.9,989 ක් වටිනා චෙක්පත් හතරක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. එම චෙක්පත් සම්බනධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. එසේම එම බැංකු ගිණුමට අදාළව දෙපාර්තමේන්තුවේ පොත් අනුව රු.115,749 ක මුදල් ශේෂයේ වෙනසක් 2014 දෙසැම්බර් මාසයේ සිට පැවැත එමින් තිබුණත්, එය නිවැරදි කිරීමටද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3.6 කාර්යසාධනය

----------------

2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 610 ක් වූ ව්‍යාපෘති 16 ක් නිම කළ යුතුව තිබුණි. ඉන් ව්‍යාපෘති 03 ක් සම්පූර්ණ කර තිබුණි. අනෙක් ව්‍යාපෘති 13 ක ප්‍රගතිය සියයට 2 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.7** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 17 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 156 | 128 | 28 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 434 | 339 | 95 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් ) | - | 01 | - | 01 |
| | **එකතුව** | **618** | **490** | **129** | **01** |